**සීමාසහිත ලංකා නැව් සංස්ථාව - 2021/2022**
**----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සීමාසහිත ලංකා නැව් සංස්ථාවේ ("සමාගම") 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා සමාගම පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි  නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශන වල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, සමාගමේ අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන  වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සමාගම සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සමාගම සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍යප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම් වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමටප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ)** දේපල පිරියත සහ උපකරණ” පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 (LKAS 16) හි 51 වැනි ඡේදය ප්‍රකාරව, වත්කමක අවශේෂ වටිනාකම සහ ඵලදායි ජීව කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂිත අගය පෙර ඇස්තමේන්තුවට වඩා වෙනස් වන්නේ නම්, ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවේ වෙනස්වීම් සහ දෝෂ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS 8) ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස අදාල වෙනස (වෙනස්කම්) ගිණුම්ගත කල යුතුය. සමාගමේ ජංගම නොවන වත්කම් සඳහා වාර්ෂිකව ඉතිරිව ඇති වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කිරීමට අපොහොසත් වීම හේතුවෙන්, තවදුරටත් භාවිතා කරන සම්පූර්ණ ක්ෂය වූ ස්ථාවර වත්කම්වල ඇස්තමේන්තුගත පිරිවැය ඒ අනුව සකස් කර නොතිබුණි. සම්පූර්ණයෙන් ක්ෂය වූ (තවදුරටත් භාවිතා කරන) ස්ථාවර වත්කම් වල පිරිවැය රුපියල් මිලියන 51.687 කි. | මූල්‍ය ප්‍රකාශන අංක 3.3 (d) හි සටහනට අනුව, වාර්තා කරන අවසන් දින සිට සැලකියයුතු වෙනසක් ඇති බවට ඇඟවීමක් තිබේ නම්, වත්කම්වල අවශේෂ අගයන්, ප්‍රයෝජනවත් ආයුකාලය සහ ක්ෂයවීම් ක්‍රම සමාලෝචනය කර සුදුසු නම්, අපේක්ෂිත පරිදි සකස්කරනු ලැබේ. කළමනාකරණයේ විනිශ්චය මෙම අගයන්, අනුපාත ක්‍රම ඇස්තමේන්තු කිරීමේදී ක්‍රියාත්මක වන අතර එබැවින් ඒවා අවිනිශ්චිතතාවයට යටත් වේ. | සෑම වත්කමක්ම ප්‍රමිතියට අනුව වාර්ෂිකව සමාලෝචනය කළ යුතු අතර සම්පූර්ණයෙන්ම ක්ෂය වූ (වත්කම් භාවිතා කරමින් පවතී නම්) ඒවායේ ප්‍රයෝජනවත් ආයු කාලය සලකා බලා නැවත තක්සේරු කර ගිණුම්ගත කළ යුතු බව |

| | | |
|---|---|---|
| **(ආ)** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 (LKAS 16) හි 7 වැනි ඡේදයට අනුව, යම් දේපල පිරියත සහ, උපකරණවල පිරිවැය එම අයිතමයට සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට සම්භාවිතාවක් තිබේ නම් එය වත්කමක් ලෙස පිළිගනු ලබන අතර භාණ්ඩයේ පිරිවැය විශ්වාසනීයව මැනිය හැකිවිය යුතුය. කෙසේවෙතත්, ඊට පටහැනිව සමාගමට අයත් යාත්‍රා දෙක සඳහා මිලදීගත් රු.9,467,137 ක උපකරණ, ස්ථාවර වත්කම් ලෙස ගිණුම් වලට ගෙන නොතිබූ අතර සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂයවීම්ද ගිණුම්වල ගලපා නොතිබුණි. | ලංකා නැව් සංස්ථාවේ සාමාන්‍ය පිළිවෙත වූයේ නැව් සඳහා ස්ථාවර වත්කම් සැපයුම්, වත්කම් ලෙස නොසලකන අතර ගිණුම්කරණ පිළිවෙත ලෙස නැව් නඩත්තු කිරීමට දරන පිරිවැයට එකතු කිරීමයි. යාත්‍රාවල භාවිතා කරන ස්ථාවර වත්කම්වල ප්‍රයෝජනවත් ආයුකාලය සමාගමෙහි සාමාන්‍යයෙන් භාවිතා කරන ස්ථාවර වත්කම්වල ප්‍රයෝජනවත් ආයුකාලයට වඩා අඩු අතර එම ස්ථාවර වත්කම් මුහුදේ කාලගුණික තත්ත්වය හේතුවෙන් බාදනයට ලක්වේ. එවිට එම වත්කම්වල ප්‍රයෝජනවත් ආයුකාලය අඩුවේ. එබැවින් එම සීමිත ආයුකාලය තුළ මෙම වත්කම් ක්ෂය කරන්නේ කෙසේද යන්න පිළිබඳව ලංකා නැව් සංස්ථාවට වඩා සුදුසු උපදෙස් අවශ්‍යවේ. තවද, අප කර්මාන්තයේ ස්වභාවය පිළිබඳ සැලකිල්ලට ගත යුතුව ඇත. | ගිණුම්කරණ ප්‍රමිතියට අනුව, වත්කම් වසරකට වැඩි කාලයක් භාවිතා කිරීමට බලාපොරොත්තු වන විට සහ භාණ්ඩ හෝ සේවා නිෂ්පාදන හෝ සැපයීමේ කාර්ය සඳහා තබා ගන්නේ නම්, එය ස්ථාවර වත්කම් ලෙස සැලකිය යුතු ඒවායේ ක්ෂයවීම් ද ගැලපිය යුතු බව. |
| **(ඇ)** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 21 (LKAS 21) හි 23 (අ) ඡේදයට අනුව, එක් එක් වාර්තාකරණ කාලසීමාව අවසානයේ විදේශ මුදල් අයිතම වසර අවසාන අනුපාතය භාවිතා කර පරිවර්තනය කළ යුතුය. කෙසේ වෙතත්, ඊට පටහැනිව, සමාගම විසින් රු.316,169,677 (USD 1,845,981) ක විදේශීය ණයගැතියන් වසර අවසාන අනුපාතයට පරිවර්තනය කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස විදේශීය ණයගැතියන් රු.222,561,587 කින් අඩුවෙන් දක්වා තිබුණි. | අපි දැනටමත් 2021/22 වසර සඳහා විදේශීය ණයගැතියන් හානිකරණයකර ඇත. ඒ අනුව, අපගේ මතය නම් විනිමය අනුපාතිකයට සාපේක්ෂව වටිනාකමක් අවශ්‍ය නොවේ යන්නයි. විදේශීය ණයගැතියන් වසර අවසාන විනිමය අනුපාතිකයට තක්සේරු කරන්නේ නම්, හානිකරණය හේතුවෙන් ණයගැති ප්‍රමාණය අධි ගණනය වීමක් සිදුවේ. | ගිණුම්කරණ ප්‍රමිතියට අනුව, විදේශීය ණයගැතියන්ගේ වසර අවසාන ශේෂය, වසර අවසානයේ ඇති විනිමය අනුපාතයට පරිවර්තනය කර ගිණුම්වල පෙන්විය යුතු බව. |
| **(ඈ)** ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 09 (SLRFS 09) හි 5.5.15 අ (ii) ඡේදයට අනුව සමාගම විසින් සෑම විටම හානිකරණ ප්‍රමාණය මැනිය යුත්තේ, වෙළඳ ණයගැතියන් සඳහා ජීවිත කාලය තුළ අපේක්ෂිත ණය පාඩුවලට සමාන මුදලකිනි. කෙසේ වෙතත්, සමාගම බොල් ණය ප්‍රතිපාදන තීරණය කිරීම සඳහා අපේක්ෂිත ණය හානිකරණ ප්‍රවේශයක් යෙදීම වෙනුවට වෙළඳ ණයගැතියන්ගෙන් රු.1,288,730,656 ක සාමාන්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබුණි. | අපි ආදායම් හඳුනා ගැනීම සඳහා SLFRS 15 අවශ්‍යතාවය සම්පූර්ණ කර ඇති අතර පාරිභෝගික අවශ්‍යතා සපුරාලීමෙන් පසු ඉන්වොයිස්කර ඇත. සමහර තත්ත්වයන් තුළ, තනි පුද්ගල පදනමක් මත ජීවිත කාලය තුළ අපේක්ෂිත ණය හානිකරණය මැනීමට අවශ්‍ය සාධාරණ තොරතුරු ආයතනයට පහසුවෙන් හෝ අනවශ්‍ය පිරිවැයකින් තොරව ලබා ගත නොහැකි බැවින් අපේක්ෂිත ණය අලාභ හානිකරණය මැනීම, සාමූහික පදනමක් මත පිළියෙළ කරනු ලැබේ. | වෙළඳ ණයගැති අගයන්හි නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය සඳහා කළමනාකරණය විසින් නිසි පුද්ගල හානිකරණ ක්‍රමයක් භාවිතා කළ යුතු බව. |

| | | |
|---|---|---|
| **(ඉ)** ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 07 (SLRFS 07) හි මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් කාණ්ඩවල 8 වැනි ඡේදයට අනුව, පහත සඳහන් එක් එක් කාණ්ඩවල ප්‍රමාණයන් SLFRS 9 හි නිශ්චිතව දක්වා ඇති පරිදි ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමකින් මනිනු ලබන මූල්‍ය වත්කම් සහ ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමකින් යුත් මූල්‍ය වගකීම් මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ හෝ සටහන් තුල වෙන වෙනම හෙළිදරව් කළ යුතුය. කෙසේ වෙතත්, සමාගමේ මූල්‍ය ප්‍රකාශන ප්‍රමිතියෙහි අවශ්‍යතාවය අනුව සකස් කර නොතිබුණි. | SLRFS 7 සහ 9 අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මෙන්ම සටහන් වලද ලංකා නැව් සංස්ථාව විසින් මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් පැහැදිලිව වර්ගීකරණය කර ඇත. | සංශෝධිත ප්‍රමිතියට අනුව, මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හෙළිදරව් කළ යුතු බව |

### 1.5.3 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 මාර්තු 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අලාභය රු.5,765,379,292 ක් වූ අතර සමුච්චිත පාඩුව රු.9,328,463,864 ක් විය. තවද, 2022 මාර්තු 31 දිනට සමාගමේ ශුද්ධ වත්කම්වල අගය රු.7,914,226,190ක සෘණ අගයක් විය. වර්ෂය සඳහා වූ අලාභය සහ සමාගමේ ශුද්ධ වත්කම් වල සෘණ ශේෂය පෙර වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 608.87කින් සහ සියයට 287.65කින් ඉහළ ගොස් ඇත. සමාගමේ අඛණ්ඩ පැවැත්ම සම්බන්ධව පවතින අවිනිශ්චිතතා පිළිබඳව පැහැදිලි ඇඟවීමක් ඇති බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ අලාභයට ප්‍රධාන හේතුව වූයේ 2022 මාර්තු 31 දිනට එක්සත් ජනපද ඩොලර් ණය ශේෂය ශ්‍රී ලංකා රුපියල් අගයට පරිවර්තනය කිරීමෙන් පැන නැඟුණු රු.6,081,305,456ක් වූ විනිමය අලාභයි. මෙම තත්ත්වය මඟ හරවා ගැනීම සඳහා 2021 ජුලි 30 වැනි දින පැවති විශේෂ මහා සභා රැස්වීමේදී (EGM) සමාගම ක්‍රියාමාර්ග යෝජනා කර තිබුණද, එම අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021/2022 වර්ෂය සඳහා වාර්තා වූ මූල්‍ය අලාභයට හේතු වූයේ බැංකුවෙන් ණය ලබාගත් දිනයේ සිට වත්මන් වර්ෂය දක්වා එක්සත් ජනපද ඩොලර් ණයෙහි අසාමාන්‍ය විනිමය අනුපාත වෙනස් වීමයි. එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අප්‍රමාණය වීම සමාගමට අහිතකර ලෙස බලපන ලදි. නමුත් එය 2015/2016 යාත්‍රා ණය ගත් වර්ෂය හා සසඳන විට ශ්‍රී ලංකා රුපියල 2021/2022 දී එක්සත් ජනපද ඩොලර් යාත්‍රා ණය විනිමය පාඩුව රු.මිලියන 6,081.3කි. එය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව වාර්ෂික ගිණුම් වල ගැලපීම අනිවාර්ය විධි විධානයකි.<br>මූල්‍ය ගිණුම්වල දක්නට ලැබෙන විනිමය අලාභ වෙනස වළක්වා ගැනීම සඳහා සහ වඩාත් හිතකර කොන්දේසි යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා එක්සත් ජනපද ඩොලර් ණය ශ්‍රී ලංකා රුපියල බවට පරිවර්තනය කිරීමට සමාගම විසින් පූර්ව ආරක්ෂණ පියවර ගෙන තිබුණි. එක්සත් ජනපද ඩොලර් ණය වඩාත් හිතකර නියමයන් සහ කොන්දේසි සඳහා ප්‍රතිව්‍යුහගත කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇතත්, එම ණය මුදල ශ්‍රී ලංකා රුපියල් අගයට පරිවර්තනය කිරීමට මහ බැංකුව අනුමැතිය ලබා දී නොමැත. | සමාගම මුහුණ දෙන අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ගැටළුව මඟහරවා, ගැනීම සඳහා විශේෂ මහා සභා රැස්වීමේදී යෝජනා කර ඇති අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට කළමනාකාරීත්වය පියවර ගත යුතු බව. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශේෂ තහවුරු කිරීම් ඇතුළුව ප්‍රමාණවත් හා සුදුසු සාක්ෂි නොමැතිකම හේතුවෙන් ණයගැතියන් 30 දෙනෙකුගේ එකතුව රු.2,402,410,757ක් වූ ණයගැති ශේෂයන්හි සහ ණයහිමියන් 16 දෙනෙකුගේ එකතුව රු.49,912,076 ක් වූ ගෙවිය යුතු වෙළඳ ණයහිමියන්ගේ ශේෂයන්හි නිවැරදිතාවය හා පැවැත්ම විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය. | විගණකවරුන්ගේ උපදෙස් පරිදි, නීතිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන ලද ණයගැතියන් හැර අනෙකුත් සියලුම ණයගැතියන්ගේ ශේෂය තහවුරු කිරීම ලංකා නැව් සංස්ථාව විසින් දැනටමත් යවා ඇත.<br>විගණකවරුන්ගේ උපදෙස් පරිදි අපි බොහෝ වාරයක් ලංකා නැව් සංස්ථාව ගණුදෙනුකරුවන්ගෙන් ශේෂය තහවුරු කරන ලෙස ඉල්ලා සිටියද ඔවුන් ප්‍රතිචාර දක්වා නැත. කෙසේ වෙතත්, අපි ලයිනර් / මෙහෙයුම් වරලත් / සැපයුම් දෙපාර්තමේන්තු විසින් උපදෙස් ලබා දී ඇති පරිදි අදාළ පාර්ශ්ව වෙත ඉන්වොයිසි ලබා දී ඇත. අවශ්‍ය නම්, ඔබට භාණ්ඩ ප්‍රකාශන, බඩු තොග බිල්පත්, මිල ගණන්, ලයිනර් සහ මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ පාරිභෝගික පිළිගත් ලේඛනවැනි අනෙකුත් ලේඛන ගනුදෙනු තහවුරු කිරීම ලෙස පරීක්ෂා කළ හැකිය. | ණයගැති ශේෂයන් අයකර ගැනීම සඳහා කළමනාකරණය විසින් නිසි අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වාදිය යුතුය. පසු විපරම් ක්‍රියාමාර්ගගත යුතු අතර වාර්ෂික ශේෂය තහවුරු කිරීමේ ක්‍රියාපටිපාටිය නිසි ලෙස ක්‍රියාත්මක කළ යුතු බව. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ)** 2022 මාර්තු 31 දිනට භාණ්ඩ ප්‍රවාහන නිෂ්කාශන, රජයේ බහාලුම් තැන්පතු සහ අනෙකුත් ණයගැතියන්ගේ මුළු එකතුව රු.80,900,481කි. එයින් රු.77,275,095ක් එනම් සියයට 96ක් වසර තුනක් තිස්සේ අයකර නොගෙන ඉතිරිව තිබුණි. | අප විසින් මාසික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට/අමාත්‍යාංශයට ඔවුන්ගේ තොරතුරු/අවශ්‍ය විධිවිධාන සඳහා ලැබිය යුතු දෑ සියල්ල ඉදිරිපත් කර ඇත. අයකර නොගත් ලැබිය යුතු මුදලින් සියයට 80 ක් සීමාසහිත ලංකා ගල් අඟුරු සමාගමට අයත් වන අතර ලංකා නැව් සංස්ථාව එය අයකර ගැනීමට පූර්ණ උත්සාහයක් දරයි. | ණයගැති ශේෂයන් අයකර ගැනීම සඳහා කළමනාකරණය විසින් නිසි අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දිය යුතු බව |
| **(ආ)** නියෝජිතයින් 18 දෙනෙකුගෙන් ලැබිය යුතු රු.3,727,680 දක්වා වූ නියෝජිතායතන කොමිස් මුදල් අයකර ගැනීමකින් තොරව වසර තුනක් පුරා පැවති අතර ඉන් නියෝජිතයින් 17 දෙනෙකුගේ හිඟ ශේෂය රු.2,008,015 කි. කෙසේ වෙතත්, එම නියෝජිතයින් සේවයේ පවා නොමැති බවත් විගණන පරික්ෂණ කටයුතු සඳහා සේවා ගිවිසුම් ලබාදී නොමැති බවත් නිරීක්ෂණය විය. | අපි දැනටමත් 2022/2023 වර්ෂය සඳහා නියෝජිතායතන මගින් රු.216,608.50 ක් අයකර ගෙන ඇත. ඒ අනුව, වසර තුනක කාලයක සිට මේ දක්වා වූ පවතින නියෝජිතායතන වල ශේෂය රු.1,719,664.50 කි.ඒ හැර රු.2,008,015 ක ශේෂය 1999 සිට IFS පද්ධතිය තුල දිගුකාලීනව පවතින ආරම්භක ශේෂයකි. | ණයගැති ශේෂයන් අයකර ගැනීම සඳහා කළමනාකරණය විසින් නිසි අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දිය යුතු අතර අවශ්‍ය අවස්ථාවලදී ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතු බව. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** 2007 අංක 07 දරන සමාගම් පනතේ 133 වගන්තිය. | වාර්ෂික මහා සභා රැස්වීම ශේෂ පත්‍ර දිනයෙන් පසු මාස 06 කට නොවැඩි කාලයක් තුල සහ පෙර වාර්ෂික මහා සභා රැස්වීමෙන් මාස 15කට නොවැඩි කාලයක් තුළ පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, 2017/18 න් පසු වාර්ෂික මහා සභා රැස්වීම් පවත්වා නොතිබුණි. | වාර්ෂික මහා සභා රැස්වීම 2019/06/28 දින පවත්වා ඇති අතර, නියමිත පරිදි වරින් වර අතිරේක මහා සභා රැස්වීම් අඛණ්ඩව පවත්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද යෝජනා සහ එම රැස්වීම්, එකම කොටස් හිමියා වන මහා භාණ්ඩාගාර නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් පවත්වා ඇත. | සමාගම් පනතේ සඳහන් පරිදි වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විය යුතු බව. |
| **(ආ)** 2018 අංක 19 ජාතික විගණන පනතේ 16.2 වගන්තිය සහ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය. | ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාගමේ මූල්‍ය ප්‍රකාශන මාස හයක ප්‍රමාදයකින් යුතුව 2022 දෙසැම්බර් 08 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. | 2015/2016 වර්ෂයේ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමේදී මතු වූ ගැටලු කිහිපයක් හේතුවෙන් 2021/2022 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන/වාර්ෂික වාර්තාව නියමිත දිනට ඔබ වෙත සහ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම ප්‍රමාද වී ඇති බව පෙන්වා දෙන ලදී. | සමාගම විසින් ජාතික විගණන පනත සහ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන පොදු ව්‍යවසාය චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොතට අනුව මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවද විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු බව. |
| **(ඇ)** 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොත 3.2 වගන්තිය | චක්‍රලේඛ වලට අනුව සංග්‍රහ දීමනාව, ප්‍රවාහන දීමනාව සහ පැමිණීමේ දිරි දීමනා ගෙවීමට සමාගම අනුමැතිය ලබාගෙන නොතිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ සමාගම එකතුව රු.20,382,612 ක් වූ දීමනා ගෙවා තිබුණි. | මෙම දීමනා තුන ලංකා නැව් සංස්ථාවේ සේවකයින්ට දිගු කලක සිට ගෙවනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය පත්‍රිකා අංක 42/2013 සඳහා 2013.08.01 දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ලද අනුමැතිය මත සංග්‍රහ දීමනාව රු.5000 දක්වා වැඩිකරන ලද අතර ප්‍රවාහන දීමනා සහ පැමිණීමේ දිරිගැන්වීම් ද එම මණ්ඩල පත්‍රිකාවෙන්ම වැඩි කරන ලදී. අමතර දීමනා පිළිබඳ විස්තර වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත. | ලංකා නැව් සංස්ථාව සම්පූර්ණයෙන්ම රජය සතු සමාගමක් වන බැවින්, එය භාණ්ඩාගාර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අදාළ චක්‍රලේඛ අනුගමනය කළ යුතුය. ඒ අනුව සියලුම දීමනා ගෙවීම සඳහා අනුමැතිය ලබාගත යුතු බව. |

## 1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 සැප්තැම්බර් 03 දිනැති අංක VAT/Gen/04 දරන ලිපිය මගින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති උපදෙස් අනුව මුදල් පදනම මත එකතු කළ අගය මත බද්ද ගෙවීමට සමාගම බැඳී සිටියද, 2012 නොවැම්බර් 19 වැනි දින සිට 2018 ජනවාරි 16 දින දක්වා ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම වෙතින් එකතු කළ අගය මත බද්ද අයකර ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් ගෙවිය යුතු එකතු කළ අගය මත බද්ද ලෙස රු.66,419,287 ක් ඉතිරිව තිබුණි. තවද, ලංකා ගල් අඟුරු සමාගම අතර ඇති වූ ආරවුල සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2018 ජනවාරි 17 වැනි දින ලිපි අංක ACT 17/9 යටතේ පැහැදිලි කිරීමක් නිකුත් කර ඇත. සමාගම විසින් සපයනු ලබන බත්තල් සේවා 2018 ජනවාරි 17 දින සිට ශුන්‍ය අගයක් ලෙස සලකනු ලබන අතර ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම විසින් එම පැහැර හරින ලද එකතු කළ අගය මත බද්ද සමාගමට ගෙවිය යුතුව තිබුණි. මෙම ආරවුල දීර්ඝ කාලයක් තිස්සේ නොවිසඳී පැවති අතර ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමෙන් පැහැර හරින ලද එකතු කළ අගය මත බද්ද අය කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවීමට සමාගම කටයුතු කර නොතිබුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව 2018-01-17 සිට සියලුම බත්තල් මෙහෙයුම් කටයුතු එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කර ඇත. කෙසේ වෙතත්, ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම 2012 වසරේ සිට සම්පූර්ණ මෙහෙයුම් සඳහා බත්තල් ගාස්තු ඇතුළුව පිරිවැය, රක්ෂණය සහ භාණ්ඩ ප්‍රවාහන (CIF) අගය මත රේගු සඳහා එකතු කළ අගය මත බදු ගෙවා ඇත. ඊට අමතරව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් බදු පදනම සඳහා වන බත්තල් ගාස්තුද අන්තර්ගතව එකතු කළ අගය මත බද්ද ගෙවීම සඳහා ඔවුන්ගේ ලිපියේ 3 සහ 6 ඡේදවල කරුණු පැහැදිලි කිරීම් කර ඇත. එබැවින් ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම දෙවන වරටත් බත්තල් ගාස්තු මත එකතු කළ අගය මත බදු ගෙවීමට බැඳී නැත. එපමණක් නොව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයෙන් මෙම නියෝගය නිකුත් කර ඇති අතර එය එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කළ යුතුය. | අදාළ පාර්ශව සමඟ සාකච්ඡා පවත්වා ගැටලුව විසඳීමට කළමනාකාරීත්වය පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

[

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 4,567,786,074 ක අලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අලාභය රු.527,125,027 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,040,661,047 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මූල්‍ය වියදම් රු. 5, 367,569,666 කින් එනම් සියයට 372 කින් සහ ඍජු වියදම් රු.3,663,751,090 කින් එනම් සියයට 179 කින් ඉකුත් වසරට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ වර්ධනය වීම එම පිරිහීමට හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වසර හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතම විශ්ලේෂණය පහත පරිදි වේ.

| අයිතමය | 2021/2022<br>රු. | 2020/2021<br>රු. | වැඩිවීම/ (අඩුවීම)<br>රු. | ප්‍රතිශතයවැඩිවීම/ (අඩුවීම) |
|---|---|---|---|---|
| මුළු ආදායම | 7,876,816,356 | 3,094,619,027 | 4,782,197,329 | 155 |
| සමාගමට අයත් නැව් මගින් භාණ්ඩ ප්‍රවාහන ආදායම | 439,788,449 | 1,425,339,909 | (985,551,460) | (69) |
| සමාගමට අයත් නැව් මගින් කුලී ආදායම | 2,978,237,896 | 587,535,533 | 2,390,702,363 | 407 |
| කුලියට ගත් නැව් මගින් ගල් අඟුරු ප්‍රවාහන ආදායම | 2,246,567,897 | - | 2,246,567,897 | 100 |
| භාණ්ඩ නිෂ්කාශන ආදායම | 18,165,709 | 8,337,584 | 9,828,125 | 118 |
| මුහුදු ගමන් | 1,802,122,355 | 597,832,869 | 1,204,289,486 | 201 |
| ඍජු වියදම් | 5,706,572,098 | 2,042,821,008 | 3,663,751,090 | 179 |
| දළ ලාභය | 2,170,244,258 | 1,051,798,018 | 1,118,446,240 | 106 |
| මූල්‍ය වියදම් | 6,808,841,215 | 1,441,271,549 | 5,367,569,666 | 372 |
| විනිමය අලාභ | 6,081,305,456 | 684,460,191 | 5,396,845,265 | 788 |
| පොළී වියදම් - (යාත්‍රා සඳහා ගත් ණය පොළී ) | 1,657,034,724 | 1,020,271,290 | 636,763,434 | 62 |

## 2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වසරට සාපේක්ෂව ජංගම වත්කම් අනුපාතය, ක්ෂණික වත්කම් අනුපාතය, දළ ලාභ අනුපාතය සහ තෝලන අනුපාතය වැනි ප්‍රාග්ධන අනුපාත පහත පරිදි වේ.

| | 2021/2022 | 2020/2021 |
|---|---|---|
| **ලාභදායිත්ව අනුපාත** | % ( ප්‍රතිශතය) | % ( ප්‍රතිශතය) |
| දළ ලාභ ආන්තිකය | 28 | 34 |
| බදු ගෙවීමට පෙර ශුද්ධ අලාභ ආන්තිකය | 58 | 17 |
| හිමිකම් මත ප්‍රතිලාභ | (73) | (40) |
| වත්කම් මත ප්‍රතිලාභ | (46) | (7) |
| කොටසක් සඳහා ඉපයීම් | (914) | (105) |
| **ද්‍රවශීලතා අනුපාත** | | |
| ජංගම අනුපාතය | 0.90 | 1.15 |
| ක්ෂණික අනුපාතය | 0.81 | 1.02 |

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ විනිමය අලාභය සියයට 788 කින් සහ මූල්‍ය වියදම් සියයට 372 කින් වැඩි වීම සමාලෝචිත වර්ෂයේ ශුද්ධ අලාභ ආන්තිකය ඉහළ යාමට ප්‍රධානව හේතු විය.

(ආ) ජංගම වත්කම් සහ ජංගම වගකීම් පිළිවෙලින් සියයට 33 කින් සහ සියයට 69 කින් වැඩිවී තිබුණද, වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ සියයට 50 කින් සීඝ්‍ර ලෙස ඉහළ යාමත් කෙටි කාලීන ණය ගැනීම් සියයට 62 කින් ඉහළ යාමත්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව ජංගම අනුපාතය පහල යාමට හේතු විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය වැඩි දියුණු කිරීම හේතුවෙන් කොටසක සෘණ ඉපැයීම් වත්මන් වර්ෂය අවසන් වන විට රු. 105 සිට රු.914 දක්වා ඉහළ ගොස් ඇත.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම විසින් නිවාස ව්‍යාපෘතියක් සඳහා කොළඹ 15 අලුත් මාවතේ 18 වැනි පටුමගෙහි පිහිටි ඉඩමක් ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් අත්පත්කර ගැනීම සඳහා 1979 ජූලි 23 වැනි දින රු.250,000 ක් ගෙවා තිබුණු අතර මෙම ඉඩම සමාගමේ නමට පැවරීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ද ලබා දී තිබුණි. ඉඩම 1994 දී රු.4,000,000 ක් ලෙස ප්‍රත්‍යාගණනය කර සහ මූල්‍ය ප්‍රකාශන වල දේපල පිරියත සහ උපකරණ යටතේ පෙන්වා ඇති අතර, 2022 ජූනි 15 දින දක්වා ම මෙම ඉඩම සමාගමේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ඉඩම 1994 වර්ෂයේ දී රු.මිලියන 4 කට ප්‍රත්‍යාගණනය කර ඇති අතර එය මූල්‍ය ප්‍රකාශනවල පිරියත සහ උපකරණවල පෙන්වා ඇත. ලංකා නැව් සංස්ථාව විසින් රු.250,000/- වරාය කොමසාරිස්ගේ ගිණුමට හිමිකම් පැවරීමක් සඳහා එම ගෙවීමේ කුවිතාන්සිය වරාය කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇත. | ඉඩම සමාගමේ නමට පවරා ගැනීමට කටයුතු කළ යුතු බව |
| (ආ) | සමාගම යාත්‍රා දෙකක් තැනීම සඳහා 2016 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 70.00 ක කාලීන ණයක් ලබාගෙන ඇති අතර, 2018 පෙබරවාරි 03 දිනට බැංකුවට ගෙවිය යුතු ණය ප්‍රාග්ධන ශේෂය වසර 15 සිට අවුරුදු 20 දක්වා සංශෝධනය කර ඇත. කාලීන ණය සම්බන්ධයෙන් වූ සංශෝධිත ණය කොන්දේසි අනුව, ණය ආපසු ගෙවීම ඇමරිකානු ඩොලර් මිලියන 2.03 ක බැගින් වූ ද්විවාර්ෂික වාරික මගින් සිදු කළ යුතුය. 2022 මාර්තු 31 දින දක්වා වාරික වශයෙන් ඩොලර් මිලියන 18.27ක් ගෙවිය යුතුව තිබුණද, සමාගම ගෙවා තිබුණේ ඩොලර් මිලියන 12.275ක් පමණක් වන අතර සමාලෝචිත වසර අවසාන වන විට ද හිඟ ණය වාරිකය වන ඩොලර් මිලියන 5.995ක් සමාගම විසින් ගෙවා නොතිබුණි. | ලංකා නැව් සංස්ථාව විසින් ඇමෙරිකානු ඩොලර් මිලියන 70 ක කාලීන ණයක් සහ ඇමෙරිකානු ඩොලර් මිලියන 5.5 ක පොලී ප්‍රාග්ධණීත ණයක් ලබා ගෙන ඇත. තවද බැංකුව සමඟ කාලීන ණය සඳහා වසර 15 සිට අවුරුදු 20 දක්වා දීර්ඝ කරන ලද ගිවිසුම් තුනකට (බැංකු පහසුකම් පිරිනැමීමේ ලිපිය) එකඟ වී අත්සන් කරන ලදී. ණය ගැනුම්කරුට ඉහත කොන්දේසි සපුරාලීමට නොහැකි නම්, සහන කාලය අර්ධ වාර්ෂිකව වරින් වර දීර්ඝ කෙරෙන අතර මෙය 2021.08.03 දක්වා අඛණ්ඩව පවතිනු ඇත.<br>ඒ අනුව, 2021/08/03 දක්වා වාරික ණයෙහි ප්‍රාග්ධන සංරචකය ගෙවීමට ප්‍රමාණවත් අරමුදල් අප සතුව නොමැති විය. තවද 2016/10/12 දිනැති ගිවිසුමට අනුව පොලී ප්‍රාග්ධනිත ණය සඳහා සහන කාලය දීර්ඝ කර ඇත. ඒ අනුව ඇමෙරිකානු ඩොලර් මිලියන 5.995 ක හිඟ මුදලක් නොමැත. | එකඟ වූ පරිදි ණය පියවීමට කළමනාකාරිත්වය කටයුතු කළ යුතු බව. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ ප්‍රධාන අරමුණ වූයේ මුහුදු මාර්ගයෙන් භාණ්ඩ, තැපැල් සහ මගීන් ප්‍රවාහනය සඳහා සේවා ක්‍රියාත්මක කිරීම සහ නැව් හිමිකරුවන්, නැව් සහ යාත්‍රා වල වරලත්, නැව් තැරැව්කරුවන්, නැව් නියෝජිතයන් සහ වෙනත් අනුබද්ධ සේවාවන් ලෙස ව්‍යාපාර කරගෙන යාමයි. සමාලෝචිත වර්ෂය තුළ සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණ වලදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය. | | |
| **(අ)** 2016 ජනවාරි 21 දිනැති අංක අමප/16/0035/737/003 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව සහ 2005 මැයි 06 දිනැති අංක 415 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධානවලට අනුව, සියලුම රාජ්‍ය ආයතන භාණ්ඩ ආනයනය කළ යුත්තේ සමාගම හරහා වන අතර එහිදී සමාගම, රාජ්‍ය ආයතනවලට ද ප්‍රමුඛත්වය ලබා දිය යුතුය. කෙසේ වෙතත්, 2018 ජනවාරි 01 සිට 2021 දෙසැම්බර් 31 දක්වා රාජ්‍ය අංශයේ භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ අවස්ථා ගණන පරීක්ෂා කිරීමේදී, සමාගම හරහා භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ අවස්ථා ගණන සාපේක්ෂව අඩු වී ඇති බව නිරීක්ෂණය විය. විස්තර පහත දක්වා ඇත. | 2005 මැයි 06 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 415 සහ 2016 පෙබරවාරි 18 දිනැති රාජ්‍ය මූල්‍ය ලිපි අංක 03 ප්‍රකාරව, සියලුම රාජ්‍ය ආයතන ඔවුන්ගේ ණයවර ලිපියේ දක්වා ඇති පරිදි FOB නියමයන් හෝ වෙනත් ඒ හා සමාන INCO කොන්දේසි මත තම මිලදී ගැනීම් කටයුතු සම්පාදනය කිරීම අවශ්‍ය වන අතර භාණ්ඩ ප්‍රවාහනය කළ යුත්තේ ලංකා නැව් සංස්ථාව විසින් නම් කරන ලද යාත්‍රා මතය. 2020 වන විට නැව් සංස්ථාව විසින් සිදු කරන ලද නැව්ගත කිරීම් වල සැලකිය යුතු වර්ධනයක් ඇති නමුත්, Covid-19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ ගෝලීය ආර්ථික අවපාතය සහ ශ්‍රී ලංකා ආර්ථිකයේ සිදු වූ දැඩි මූල්‍ය අර්බුදය හේතුවෙන් සමස්තයක් ලෙස රටේ ආනයන කටයුතු 2021 වර්ෂයේදී බොහෝ දුරට සීමා විය. | සමාගම හරහා භාණ්ඩ ආනයනය කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය ආයතනවල බලධාරීන් දැනුවත් කිරීමට කළමනාකාරිත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව. |

| වර්ෂය | වාර ගණන |
|---|---|
| 2018 | 1981 |
| 2019 | 1790 |
| 2020 | 2172 |
| 2021 | 1533 |

| | | |
|---|---|---|
| **(ආ)** රාජ්‍ය අංශයේ ආයතන දොළහක් 2020 නොවැම්බර් 01 සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ භාණ්ඩ මෙට්‍රික් ටොන් 4,712,210 (ආනයන වාර ගණන 8,195) ක් ආනයනය කර ඇත. එයින් මෙට්‍රික් ටොන් 4,520,732ක් එනම් මුළු ප්‍රමාණයෙන් සියයට 95.9ක් ආනයනය කර ඇත්තේ විදේශීය නැව් සමාගම් විසින් වන අතර, මෙට්‍රික් ටොන් 191,478 ක් පමණක් සංස්ථාවේ නෞභාර පත් මත ආනයන කර තිබුණු අතර එය මුළු ආනයන ප්‍රමාණයෙන් සියයට 4.1 ප්‍රමාණයක් විය. ඒ අනුව මේ පිළිබඳව අදාළ බලධාරීන් දැනුවත් කිරීමට සහ සමාගම හරහා ආනයන ප්‍රමාණය වැඩි කර ගැනීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 415 ට අනුව, සියලුම රාජ්‍ය ආයතන ටෙන්ඩර් කැඳවීමේදී භාණ්ඩ සහ භාණ්ඩ ප්‍රවාහනය සඳහා වෙන වෙනම මිල ගණන් කැඳවිය යුතුය. ලංකා නැව් සංස්ථාව භාණ්ඩ ප්‍රවාහන පිරිවැය, සැපයුම්කරුගේ මිල ගණන් වලට වඩා වැඩි නම්, භාණ්ඩ ප්‍රවාහනය පෙර ගෙවුම් පදනම මත ඔවුන්ගේ මිල ගණන් අනුව නැව්ගත කිරීම සංවිධානය කිරීම සැපයුම්කරුවන්ට පැවරීමට හැකි වන පරිදි ලංකා නැව් සංස්ථාව විසින් ලිඛිත අත්හැරීමක් ඉදිරිපත් කළ යුතුය.<br><br>ඉහත සඳහන් කළ පරිදි රජය, සියලුම රාජ්‍ය ආයතන වෙත පැහැදිලි නියෝගයක් ලබා දී ඇතත්, බොහෝ රජ්‍ය ආයතන එය පිළිපදින්නේ නැත.<br><br>කෙසේ වෙතත්, රජයේ ආයතන සමඟ පමණක් නොව පුද්ගලික අංශය සමඟද අපගේ වෙළඳපල කොටස ඉහළ නැංවීමට ලංකා නැව් සංස්ථාව අමතර උත්සාහයක් ගන්නා ලදී. | සමාගම හරහා භාණ්ඩ ආනයනය කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය ආයතනවල බලධාරීන් දැනුවත් කිරීමට කළමනාකාරිත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව. |
| **(ඇ)** ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම පිළිබඳ ප්‍රගති වාර්තාව 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අනුමත ක්‍රියාකාරී සැලැස්ම සමඟ පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| **(i)** ක්‍රියාකාරී සැලැස්මේ භෞතික ඉලක්ක (වාර ගණන, ප්‍රමාණය සහ යෙදවීම් සංඛ්‍යාව) දක්වා නොතිබුණි. | 2021/2022 වර්ෂයේ භෞතික ඉලක්ක දැක්වෙන ලේඛන සපයා ඇත. | භෞතික ඉලක්ක ඇතුලත්ව ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කළමනාකාරිත්වය කටයුතු කළ යුතු බව. |
| **(ii)** බත්තල් සඳහා ඇඩ්රස් කොමිස් 690 කින් ඉහළ ගොස් ඇති අතර ආදායම් මූලාශ්‍ර නිසි ලෙස ඇස්තමේන්තු නොකිරීම හේතුවෙන් සම්පූර්ණ බහාලුම් පැටවීම (FCL) සහ බහාලුම් තොග වලට වඩා අඩු (LCL) භාණ්ඩ ප්‍රවාහනය සියයට 397කින් ඉහළ ගොස් ඇත. | ලංකා නැව් සංස්ථාවට අයවැය අනුපාතයේ ඉලක්කගත ප්‍රමාණය වෙනුවට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව 0.69/MT දක්වා බත්තල් සඳහා ඇඩ්රස් කොමිස් වැඩි කළ හැකිය.<br>ශ්‍රී ලංකා දුම්රිය හා ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් විශේෂ භාණ්ඩ නැව්ගත කිරීම් හැසිරවීම හේතුවෙන් FCL සහ LCL හි බහාලුම් භාණ්ඩ ප්‍රවාහනයේ (NVOCC) ආදායම ඉහළ ගොස් ඇත. | ක්‍රියාකාරී සැලැස්ම නිවැරදිව සකස් කළ යුතු බව. |

| | | |
|---|---|---|
| **(iii)** භාණ්ඩ ප්‍රවාහනය පිළිබඳ ඇමතුම් කොමිස් රු. මිලියන 95.35කින් ළඟා කර ගැනීමට අපේක්ෂා කළද, ඉලක්කයේ ප්‍රගතිය සියයට 0ක් විය. | සැපයුම්කරු විසින් හසුරුවන ලද භාණ්ඩ ප්‍රවාහන ගාස්තුවලට නොගැලපීම හේතුවෙන් භාණ්ඩ ප්‍රවාහනය සඳහා ඇමතුම් කොමිස් ආදායම සඳහා වාර්තා නොමැත. | ක්‍රියාකාරී සැලැස්ම නිවැරදිව සකස් කළ යුතු බව. |
| **(iv)** ගල් අඟුරු යාත්‍රා වලින් ලබන කුලී ආදායම ලෙස රු. මිලියන 2,246ක් එකතු කර තිබුණද, ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී එවැනි ක්‍රියාකාරකමක් හඳුනා ගෙන නොතිබුණි. | ඉහළ වරලත් ගාස්තු (එක්සත් ජනපද ඩොලර් 40,000/දින) නිසා Mv සිලෝන් බ්‍රීස් නෞකාව ගෝලීය වෙලඳපොල නැව් කුලියට දිමේහි යෙදවූ අතර ලංකා නැව් සංස්ථාව විසින් කැබිනට් අමාත්‍යවරුන්ගේ අනුමැතිය ඇතිව SPOT යාත්‍රාව කුලියට ගත්හ. පවතින ගෝලීය වෙළෙඳපොළ තත්ත්වය අනුව මෙම තීරණය ගෙන ඇති බැවින් ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී මෙම ක්‍රියාකාරකම දක්වා නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම නිවැරදිව සකස් කළ යුතු බව. |
| **(v)** ලංකා විදුලි බල මණ්ඩලය සඳහා ගල් අඟුරු ප්‍රවාහනයෙන් රු.මිලියන 2,085.42ක් ලබා ගැනිමට සැලසුම් කර ඇති අතර, එයින් සියයට 21ක් (රු.මිලියන 439.78) ඉලක්කයක් ළඟාකර ගෙන ඇත. | නම් කරන ලද පැටවුම් තොටේ සිට පුත්තලම නැංගුරම් පොළට ගල් අඟුරු මුහුදු ප්‍රවාහනය ලබා ගැනීම සඳහා තෝරාගත් ගල් අඟුරු සැපයුම්කරුගේ උද්ධෘත මුහුදු භාණ්ඩ ප්‍රවාහන ගාස්තුව ලංකා නැව් සංස්ථාව විසින් ගැළපිය යුතුය. එබැවින්, යථාර්ථවාදී නොවන භාණ්ඩ ප්‍රවාහන ගාස්තු, ලංකා ගල් අඟුරු සමාගම වෙතින් නැව් හිමිකරුවන් සඳහා හිඟ ගෙවීම් පැවතීම යනාදි විවිධ සාධක හේතුවෙන් ලංකා නැව් සංස්ථාව විසින් ස්ථානීය ටෙන්ඩරයක් ගැලපීම සාර්ථකව කර ඇත. සත්‍ය වශයෙන්ම ලංකා නැව් සංස්ථාව ඉලක්කයට නිසි ලෙස ළඟා වීමට නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්මෙන් අපගමනය වීම වළක්වා ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම කාලානුරූපව සමාලෝචනය කිරීමට කළමනාකාරිත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව. |
| **(vi)** පාරිභෝගික භාණ්ඩ නිෂ්කාශනය, Door Delivery සහ Pick up මගින් රු.මිලියන 22 ක් උපයා ගැනීමට සැලසුම් කර තිබුණද, එකතු කර ගෙන තිබුණේ සියයට 78ක් (රු. මිලියන 17.24) පමණි. | ගෝලීය වසංගත තත්ත්වය, ලෝක ආර්ථික අර්බුදය, විදේශ විනිමය හිඟය, අස්ථාවර දේශපාලනතත්ත්වය, රට තුළ පවතින ඉන්ධන අර්බුදය හේතුවෙන් බොහෝ රාජ්‍ය අංශයේ ආයතන සිය සුපුරුදු ආනයන නැව් ගත කිරීම් ඇණවුම් කර නොමැත. එබැවින් ලංකා නැව් සංස්ථාවට ඉලක්ක ගත අනුපාතයට ළඟා වීමට නොහැකි විය. | කළමනාකාරිත්වය විසින් ක්‍රියාකාරී සැලැස්ම කාලෝචිත ලෙස සමාලෝචනය කළ යුතු අතර ක්‍රියාකාරී සැලැස්මෙන් අපගමනය වීම වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව. |